**අපි වෙනුවෙන් අපි අරමුදල - 2017**

**---------------------------------------------------**

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලිකිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(7) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. . විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අපි වෙනුවෙන් අපි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද රු.791,200 ක් වූ රණජයපුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කුලී ආදායමට එරෙහිව රු. 34,906 ක් වූ දේශන ශාලාවේ ජල හා විදුලි වියදම් හිලව් කර තිබුණි. ඒ හේතුවෙන් රු. 34,906 කින් ආදායම හා වියදම අඩුවෙන් දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| පොදු ලෙජරයේ - ගැලපුම් සටහන් | 20,415,806 | ජර්නල් වවුචර් |
| - වැරදි නිවැරැදි කිරීමේ සටහන් | 2,297,908 | ජර්නල් වවුචර් |
| සුළු උපකරණ හා මෙවලම් | 1,064,815 | උපලේඛන |
| සුළු උපකරණ හා මෙවලම් ක්ෂය | 157,445 | උපලේඛන |
| ආයෝජන පොළී ආදායම | 111,132,876 | උපලේඛන |

### 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සන්නිවේදන සමාගම් 07 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සංනිවේදන කුළුණු ආදායම රු.22,695,823 ක් වූ අතර ඉන් රු.1,833,983 ක මුදලක් වර්ෂ 3 කට වඩා හිඟව පැවතුණි.මෙම පැරණි හිඟ ණය ශේෂය අයකර ගැනිම සම්බන්ධව පසු විපරම් ක්‍රියාමාර්ගය දුර්වල මට්ටමක පැවැතුණි. එම ශේෂ සනාථ කර ගැනීම සඳහා ද කටයුතු කර නොතිබුණි.

(ආ) රණජයපුර නිවාස ව්‍යාපෘතියේ නිවාස ලාභීන් 454 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.16,218,314 ක් වූ වාරික හිගව පැවතුණු අතර ඒ තුල වර්ෂ 02 කට වැඩි හිඟ ණය වාරික වටිනාකම රු.7,919,000 ක් විය. හිඟ වාරික අයකර ගැනිම සම්බන්ධව පසු විපරම් ක්‍රියාමාර්ග දුර්වල මට්ටමක පැවැතුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 11 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුල සිදුකරන ලද රු.151,800,000 ක් වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | මුදල් රෙගුලාසි 756 හා 757 සහ 2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 05/2016 | 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,600,518ක් වූ ස්ථාවර වත්කම් හා සුළු උපකරණ සම්බන්ධව භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 පරිච්ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | අරමුදලේ අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 196,813,687 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ද රු.103,224,875 ක අතිරික්තයක් වූයෙන් අරමුදලේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 93,588,812 ක වර්ධනයක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.17,482,960 කින් ඉහළ යාම සහ වියදම් රු.76,105,852 කින් පහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.67,310,121 ක් වූ අතිරික්තය 2014 වර්ෂයේදී රු.68,264,236 ක ඌණතාවයක් දක්වා පිරිහී තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට එය රු. 196,813,687 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී අරමුදලේ දායකත්වය 2013 වර්ෂයේදී රු. 68,438,279 ක් වී තිබුණු අතර 2014 වර්ෂයේදී එම දායකත්වය රු.63,644,362 ක සෘණ අගයක් දක්වා රු.132,082,641 කින් පිරිහී තිබුනු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට රු.199,966,878 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්ය සාධනය

----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන අරමුණු හා පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා සන්නද්ධ සේවාවල සාමාජිකයින්ට සහ මියගිය හෝ ආබාධිත රණවිරුවන් සඳහා ණය යෝජනා ක්‍රම ඇති කිරීම, නිවාස පහසුකම් ලබාගැනීමට විධිවිධාන සැලැස්වීම, ලබාගත් ණය ආපසු ගෙවීම සඳහා සහතික කිරීම වෙනුවෙන් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වැනි කර්තව්‍යයන් ඉටුකල යුතු වුවද එම කාර්යයන් සඳහා අරමුදලේ මූල්‍ය ශක්තීන් ප්‍රමාණවත් පරිදි උපයෝජනය නොකර භාණ්ඩාගාර බිල්පත්වල හා රජය සතු බැංකුවල ස්ථාවර තැන්පතු වශයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ආයෝජනය කරමින් පැවති බව නිරීක්ෂණය විය. 2017 දෙසැම්බර් 31 දිනට එලෙස රු.1,116,481,719 ක මුදලක් ආයෝජනය කර තිබුණි.

(ආ) පදිංචි ඉඩම මිලදිගැනීම/ නිවාස තැනීම හෝ අළුත්වැඩියාව සඳහා රජයේ ලියාපදිංචි මූල්‍ය ආයතන වෙතින් රණවිරුවන් ලබාගත් ණය සඳහා ණය බරින් නිදහස් වීමට එක් රණවිරුවකුට රු.1,000,000 බැගින් රණවිරුවන් 75 දෙනෙකු සඳහා මුදලින් සියයට 50 ක් වාරික 60 කින් ආපසු අයකිරීමේ පදනම මත ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම්කර තිබුනද සමාලෝචිත වර්ෂය තුලදී එම වැඩසටහන ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) නිවාසලාභීන් 100 කට අර්ධ වශයෙන් නිම කරන ලද සිය නිවාසවල ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා එක් නිවසකට රු. 250,000 බැගින් වූ වාරික 03 කින් රු.750,000 ක් වූ මූල්‍ය ආධාර වර්ෂය තුල දී ලබා දීමට වැඩසටහනක් සැලැසුම් කර ක්‍රියාත්මක කර තිබුණු නමුත් එම ආධාර මුදලේ අවසන් වාරිකය 2017 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු නිවාස ලාභියකු වෙත නිදහස්කර නොතිබුණි.

### 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

2017 වර්ෂයේ අරමුදලේ අයවැය ලේඛනය අනුව පරිත්‍යාග වශයෙන් රු. 22,300,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද, 2017 වර්ෂයේ පරිත්‍යාග ආදායම රු.653,333 ක් වැනි ඉතාපහල මට්ටමක පැවතුණි.තවද සමාලෝචිත වර්ෂයේදි කිසිදු රාජ්‍ය ආයතනයක් විසින් අරමුදල සඳහා මුදල් පරිත්‍යාග කර නොතිබුණි.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

අරමුදලේ අංක 0074243929 දරන ජංගම ගිණුමේ ශේෂය රු. 2,704,810 ක් වර්ෂ 2 කට වැඩි කාලයක් ආදායම් ඉපයීම සඳහා ඵලදායී මාර්ගයක ආයෝජනය කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

**5.	ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)	2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/ 423 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂයක් අවසන් වී මාස 02 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 03 දින ඉදිරිපත් කර තිබුණි.

(ආ)	2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා ආරම්භයේ සිට මේ දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.2	අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සැලස්ම යටතේ අපි වෙනුවෙන් අපි අරමුදල සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන් 02 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණද ඒ සම්බන්ධ වාර්තා වල පිටපත් මුදල් රෙගුලාසි 134 (3) පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5.3	ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**ප්‍රසම්පාදනයන්**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4	අයවැය පාලනය**

අරමුදල සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික අයවැයගත ව්‍යාපෘති වියදම රු.225,000,000 ක් වුවද සත්‍ය වියදම රු.164,491,380 ක් විය. මේ අනුව සැලසුම් කළ රු.60,508,620 ක් සමාලෝචිත වර්ෂය තුල උපයෝජනය කර නොතිබීම හේතුවෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.	පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර කළමනාකරණයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | - | පොදු ලෙජරයේ ගණුදෙනු සටහන් කිරීමට ජර්නල් වවුචර් පිළියෙල කර නොතිබීම, ගණුදෙනු හඳුනාගැනීම, වාර්තා කිරීම, ගිණුම් පොත්පත් යාවත්කාලීන කිරීම හා ස්ථාවර වත්කම් ලේඛණය වර්ගීකරණය කර පවත්වා ගැනීම සම්බන්ධයෙන් දුර්වලතාවයන් පැවැතීම. |

(ආ) ව්‍යාපෘති මෙහෙයවීම හා අධීක්ෂණය - ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම,ඉදිකිරීම් ප්‍රමාද වීම හා අමාත්‍යාංශ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවැතීම.

(ඇ) ආදායම් පාලනය - හිඟ සන්නිවේදන කුළුණු ගාස්තු අයකර නොගැනීම, රණජයපුර නිවාස ව්‍යාපෘතියේ හිඟ වාරික අයකර නොගැනීම.